www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජාතීන්ගේ සංවිධානය හමුවේ ශ්‍රී ලංකා ජනාධිපතිවරයාගෙන් තව තවත් කුහකකම් හා මුසා බස්

## More hypocrisy and lies from Sri Lankan president at UN

**කේ. රත්නායක විසිනි**
**2006 සැප්තැම්බර් 27**

පසු ගිය සතියේ එක්සත් ජාතීන්ගේ මහා මන්ඩලය හමුවේ පැවති විශේෂිතව ම නරුම සහගත පෙලහරක දී ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ තමන් සාමයේ මුර දේවතාවා ලෙසත් මානව අයිතීන්ගේ ආරක්ෂකයෙකු හා දුප්පතුන්ගේ වීරයෙකු ලෙසත් ලෝකය ඉදිරියේ විදහා පෑවේ ය. මෙම කියාපෑම් සෑම එකක් ම මුසාවන් ය.

රාජපක්ෂ සිය කතාව සිදු කලේ ඔහුගේ ආන්ඩුවේ සන්නද්ධ හමුදා 2002 සටන් විරාමය බරපතල ලෙස උල්ලංඝනය කරමින් දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව මෙහෙයුම් තීව්‍ර කරමින් සිටිද්දී ය. ඝාතන හා අතුරුදන් වීම් මාලාවක් ඇතුලු ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් පිලිබඳ බරපතල උල්ලංඝනයන් සිදු කිරීම සම්බන්ධ චෝදනාවන්ට මිලිටරිය ලක්ව සිටී. අගෝස්තු මස මුල දී ප්‍රන්සයෙහි පාදක වූ ඇක්ෂන් කොන්ට්‍රෙ ලා ෆෙයිම් සංවිධානයට සම්බන්ධිත සහන සේවකයන් 17 දෙනෙකු අලුගෝසු අයුරින් ඝාතනය කිරීම සම්බන්ධයෙන් මිලිටරිය වගකිව යුතු යැයි ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුව (එස්එල්එල්එම්) මෑතක දී තීන්දු කලේ ය.

"දුප්පතුන්ට හිතැති" වීම සම්බන්ධයෙන් ගත හොත්, රාජපක්ෂ නිව් යෝකයට ලඟා වූයේ, හවානාහි පැවති නොබැඳි ජාතීන්ගේ සමුලුවේ සිට කෙලින් ම ය. එම සමුලුව සඳහා ඇමතිවරුන්, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා සහායකයන් 65 දෙනෙකුගෙන් යුත් පිරිවරක් ඔහු කැටුව ගියහ. මාධ්‍ය වාර්තා අනුව එම සංඛ්‍යාව ලෝක වාර්තාවකි. ඉන් නොබැඳි සමුලුවේ සිටි වඩාත් ම හයිකාර දේශපාලන මෙහෙයුම්කාරකයන් අතරින් කීප දෙනෙකුගේ පවා ඇස් උඩ ගියේ ය. සිය අස්ථාවර පාලක සන්ධානය එක් කොට තබා ගැනීමට ඔහු දරන ප්‍රයත්නයේ කොටසක් ලෙස සංචාරය සඳහා වැය කල අධික මුදල් ප්‍රමානය සමාජයේ දුප්පත් ම ස්තරයන් වෙනුවෙන් ඇති රටේ මූලික සේවාවන් පිලිබඳව සිදු කරන වැය කප්පාදු හා සසඳන විට සුපැහැදිලි වෙනසකින් යුක්ත ය.

රාජපක්ෂ එක්සත් ජාතීන්ගේ සමුලුවේ දී තම කතාව ආරම්භ කලේ එක්සත් ජනපදයේ "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයට" සිය සහාය පොරොන්දු වෙමිනි. රාජපක්ෂ මෙසේ කී යː "ත්‍රස්තවාදය සිය කැත හිස ඔසවන්නේ කවදා ද කොතැනක දි ද, ඊට එරෙහිව සටන් කිරීමට ගෝලීය වශයෙන් දරන සියලු ප්‍රයත්නයන්ට සහාය දීමට මගේ ආන්ඩුවේ ඇති දැඩි කැප වීම යලි තහවුරු කිරීමට මම බලාපොරොත්තු වෙමි." බුෂ් පරිපාලනය ඇෆ්ඝනිස්ථානයෙහි හා ඉරාකයෙහි පවත්වා ගෙන යන නව විජිතවාදී වාඩිලෑම් හා ඉරානයට එරෙහි මිලිටරි ප්‍රහාරයක් සඳහා එය කර ගෙන යන සූදානම සම්බන්ධයෙන් රාජපක්ෂ නිහඬ විය.

වොෂින්ටනයේ නීති විරෝධී ක්‍රියාවන්ට නිහඬව සහාය දීම මගින් රටේ උතුරෙහි හා නැගෙනහිරෙහි එල්ටීටීඊ සංවිධානයට එරෙහිව තමන් ම ගෙන යන සාපරාධී " ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයට" මහ බලවතුන්ගේ සහාය ලබා ගැනීමට රාජපක්ෂ උත්සාහ කරයි. එල්ටීටීඊයට එරෙහිව දීර්ඝ වාග් ප්‍රහාරයක් දියත් කිරීම පිනිස ඔහු වේදිකාව යොදා ගත්තේ ය. සාමය සඳහා වන අපේක්ෂාව කියා පෑම වෙනුවට ඔහුගේ කතාව දැන් සිදු වන යුද්ධය පිලිබඳ ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමකට සම විය.

"අප දේශපාලනිකව ආමන්ත්‍රනය කරමින් සිටින සුලුතරයේ උත්සුකතා ගසා කමින් ශ්‍රී ලංකාව තුල සිටින දරුනු ත්‍රස්තවාදී කන්ඩායමක් වන එල්ටීටීඊය දශක දෙකකටත් වැඩි කාලයක් තිස්සේ අපගේ ජනතාව භීතියට පත් කරමින් සිටී. ලෝකය සංවාදය හා සාමය උදෙසා උත්සාහ දරමින් සිටින අවධියක එල්ටීටීඊය සිය මුලු බලය ම යොදවා ඇත්තේ ප්‍රචන්ඩත්වයට, මරා ගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයන්ට හා සිවිල් ජනයා සංහාරයට, වග විභාගයක් නැති සන්නද්ධ ප්‍රහාරයන්ට සහ තරුන ලමුන් බලෙන් යුද්ධය සඳහා බඳවා ගැනීමට ය....

"එම නිසා, එල්ටීටීඊය මුදා හල ප්‍රචන්ඩත්වය නොතකා, මා ඡන්දයෙන් තේරී පත් වී නොබෝ දිනකින් ම, අප නැවුම් ඉදිරි දැක්මක් සහ තිරසර විසඳුමක් ඇති කර ගැනීම උදෙසා වන නව ප්‍රවිෂ්ටයක් ඔස්සේ ගැටුමේ හේතු ආමන්ත්‍රනය කිරීම අවශ්‍ය ය යන ඒත්තු ගැනීම මම ප්‍රකාශයට පත් කලෙමි. අපි විවෘත මනසකින් මෙම ගැටලුව පරීක්ෂාවට ලක් කලෙමු, නොබෙදුනු

රටක් තුල ගෞරවනීය සාමයක් අත්පත් කර ගැනීම පිනිස ජාතික ඒකමතික භාවයක් ඇති කර ගැනීම සඳහා වූ දැක්මකින් යුතුව පවත්නා සියලු විකල්පයන් පිලිබඳව අපි විමසා බැලුවෙමු."

ඇමරිකානු ජනාධිපතිට මෙන් රාජපක්ෂට ද තම " ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" මූලයන් ආමන්ත්‍රනය කල නොහැකි විය. "සුලුතරයේ උත්සුකතා" පිලිබඳව ඔහු කල කෙටි සඳහන මගින් සඟවනු ලැබෙන්නේ 1948 නිදහස දක්වා අතීතයට දිවෙන, ඔහුගේ ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) විශේෂ වගකීමක් දරන, රටේ දෙමල සුලුතරයට එරෙහිව ක්‍රමානුකූලව සිදු කල වෙනස්කම් කිරීම පිලිබඳ කාරනාව යි. ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායයන් පිලිබඳ රාජපක්ෂ යලි යලිත් කල සියලු සැඳහුම් සම්බන්ධයෙන් සලකා බැලුව හොත් කිව යුත්තේ එකකට පසුව එකක් ආ හැම ආන්ඩුවක් විසින් ම මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් පාගා දමා ඇති බවත් රාජ්‍ය පාලනයේ පදනම ලෙස සිංහල වර්ගවාදී දේශපාලනය ආරක්ෂකයක් ලෙස යොදා ගැනුනු බවත් ය.

"මීට අමතරව කිව හොත්, මගේ රට අවිහිංසාව, ආදරය, කරුනාව, අනුකම්පාව, උපේක්ෂාව හා සතිය යන බෞද්ධ හර වටිනාකම්වල බලපෑමට ලක් වූවකි," යැයි රාජපක්ෂ ප්‍රකාශ කලේ ය. ඇත්ත වශයෙන් ම, 1972 දී රටේ ව්‍යවස්ථාව තුල රාජ්‍ය ආගම ලෙස බුදුදහම ස්ථාපනය කිරීම මගින් ඔහුගේ ශ්‍රීලනිපය මූලික ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම ගර්භාවට ලක් කලේ ය. " බෞද්ධ වටිනාකම්" ආරක්ෂා කිරීමේ නාමයෙන්, තමන් දරා සිටින බවට රාජපක්ෂ කුහක ලෙස ප්‍රකාශ කරන සෑම මූලධර්මයක් ම නින්දිත ලෙස කෙලෙසූ දුෂ්ට වාර්ගික යුද්ධයක් කොලඹ ආන්ඩු විසින් ගෙන ගොස් තිබේ.

ගෝලීය පරිමානයෙන් සිදු වන "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" සේ ම එහි ශ්‍රී ලාංකික ස්වරූපය ද අයුක්ති සහගත ය. ත්‍රස්තය යනු එල්ටීටීඊය තරම් ම අනුකම්පා විරහිත ලෙස ශ්‍රී ලාංකික මිලිටරිය විසින් ද යොදා ගෙන ඇති මිලිටරි උපක්‍රමයකි. වත්මන් සටන තුල දී ආන්ඩුවේ හමුදා වග විභාගයක් නැතිව නගරවලට බෝම්බ හා ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කර ඇති අතර දෙමල සුලුතරය ත්‍රස්ත කිරීම සඳහා සැලසුම් කල පැහැර ගෙන යාම්, ඝාතන හා අතුරුදන් කිරීම්වලින් සමන්විත කැත යුද්ධයක නිමග්නව සිටී. සැබවින් ම රාජපක්ෂ විසින් මුදා හැර ඇත්තේ "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයක්" නො වේ, රටේ සිංහල ප්‍රභූවේ අඛන්ඩ දේශපාලන ආධිපත්‍යය සහතික කර ගැනීමේ යුද්ධයකි.

"මා ඡන්දයෙන් තේරී පත් වී නොබෝ දිනකින්" යුද්ධය නාටකාකාර ලෙස ඉහල නැංවුනේ ඇයි ද යන්න රාජපක්ෂ පැහැදිලි කලේ නැත. ඔහු ජනාධිපතිවරනය ජයග්‍රහනය කලේ ඔහු එල්ටීටීඊයට එරෙහිව වඩා ආක්‍රමනකාරී ස්ථාවරයක් ගත යුතු යැයි ඉල්ලා සිටි ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) හා ජාතික හෙල උරුමය (ජාහෙඋ) යන සිංහල අන්තවාදී පක්ෂ දෙක සමග ඇති කර ගත් නිල මැතිවරන සන්ධානයක් ඔස්සේ ය. ඔහු ම ඉදිරිපත් කල මහින්ද චින්තනය නම් වැඩ පිලිවෙල මගින් 2002 සටන් විරාමය සංශෝධනය කල යුතු යැයි ද ඊනියා ජාත්‍යන්තර සාම ක්‍රියාවලියේ නිල පහසුකම් සපයන්නාගේ කාර්ය භාරයෙන් නෝර්වේ රාජ්‍යය ඉවත් කල යුතු යැයි ද ඉල්ලා සිටියේ ය.

එල්ටීටීඊයට එරෙහිව මාස ගනනක් තිස්සේ සිදු කල ප්‍රකෝපකරනයන්ගෙන් හා සැඟවුනු මෙහෙයුම්වලින් පසුව සටන් විරාම ගිවිසුම විවෘතව ම උල්ලංඝනය කරමින් එල්ටීටීඊ පාලන ප්‍රදේශය තුල පිහිටි මාවිල්ආරු සොරොව්ව යලි අත්පත් කර ගැනීම සඳහා බලගතු ආක්‍රමනයක් දියත් කරන ලෙස ජුලි මස දී රාජපක්ෂ නියෝග කලේ ය. මෙම "මානුෂීය" මෙහෙයුම වෙනුවෙන් යොදා ගත් ව්‍යාජ හේතුව වූයේ සොරොව්ව විවෘත කිරීම මගින් ගඟ පහල නිම්න ප්‍රදේශවල ජීවත් වන ගොවීන්ට ජලය සැපයීම යි. එල්ටීටීඊ භූමි ප්‍රදේශය තුල පවතින ජල ව්‍යාපෘතියක් අවහිර කිරීම මගින්, එයට විරෝධතාව පල කිරීමක් ලෙස කෙරුනු මෙම සොරොව්ව වසා දැමීමේ ක්‍රියාව අවුලුවා ගැනීමෙහි ලා ආන්ඩුව ඍජුව ම ක්‍රියා කර තිබුනි.

පසු ගිය දෙමස තිස්සේ, ත්‍රිකුනාමල නාවික හමුදා කඳවුරට මුහුන ලා පිහිටි සාම්පූරයේ හා යාපන අර්ධද්වීපයට දකුනින් පිවිසෙන මාර්ගයේ පිහිටි මුහමලේහි ප්‍රධාන මූලෝපායික ස්ථාන ඇතුලු එල්ටීටීඊ භූමි ප්‍රදේශ අල්ලා ගැනීම පිනිස හමුදාව තව දුරටත් ආක්‍රමන දියත් කර තිබේ. එල්ටීටීඊ ප්‍රදේශවලට හා කඳවුරුවලට යලි යලිත් එල්ල කෙරුනු ගුවන් ප්‍රහාර ඇතුලු මේ සියල්ල යුක්ති සහගත කරනු ලැබ ඇත්තේ, මිලිටරිය පැහැදිලි වශයෙන් ම එල්ටීටීඊය අක්‍රිය කිරීමේ "ආරක්ෂක ක්‍රියාවන්හි" යෙදී සිටින්නේ ය යන පවය මගිනි.

රාජපක්ෂ එක්සත් ජාතීන් හමුවේ සිය "සාම දැක්ම" හා "සුලුතරයන්ගේ උත්සුකතා ආමන්ත්‍රනය කිරීම පිනිස වූ උපදෙස් විමසීමේ ක්‍රියාවලියක් උදෙසා වන සැලසුම්" ගැන කතා කරද්දී ඔහුගේ ශ්‍රීලනිපය ජවිපෙ සිංහල ස්වෝත්තමවාදීන් ආන්ඩුව තුලට නිල වශයෙන් එක් කර ගැනීම පිනිස වූ සාකච්ඡාවන්හි යෙදී සිටියේ ය. ජවිපෙ නායකයෝ 2002 සටන් විරාම ගිවිසුම ඉරා දැමීම ඇතුලුව එල්ටීටීඊයට එරෙහිව යුද්ධ ප්‍රකාශ කිරීමක් හා සමාන කොන්දේසි අවධාරනය කරමින් සිටිති. ප්‍රධාන විරුද්ධ පක්ෂය වන එක්සත් ජාතික පක්ෂය හමුදා ආක්‍රමනවලට සහාය දෙන්නේ ය යන කරුනත් සමග එක්ව ගත් විට රාජපක්ෂ කියන "

ජාතික ඒකමතික භාවය" යන්නෙන් ඇත්ත වශයෙන් ම අදහස් වන්නේ යුද්ධය කර ගෙන යාමේ එකඟතාවකි.

රාජපක්ෂ තමන් මානව අයිතීන් ආරක්ෂා කරන්නෙකු යැයි මවා පෑම විහිලුවකි. වත්මන් හදිසි නීති තත්ත්වය යටතේ මාධ්‍ය නිදහස මැඩීම සඳහාත් හිතුවක්කාරී සෝදිසි කිරීම් හා රඳවා ගැනීම් කර ගෙන යාම සඳහාත් පොලිස් රාජ්‍ය බලතල යොදා ගැනේ.

පැහැර ගෙන යාම් හා ඝාතන නොනැවතී සිදු වෙයි. පසු ගිය දෙසැම්බරයේ සිට අගෝස්තු මස දක්වා කාලය තුල යාපන අර්ධද්වීපයෙහි සිදු වූ පැහැර ගෙන යාම් පිලිබඳ නිල පැමිනිලි 419ක් තමන් වෙත ලැබී ඇතැයි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම මෑතක දී වාර්තා කලේ ය. එම වාර්තා අනුව අගෝස්තුවේ දී පමනක් ලැබී ඇති පැමිනිලි සංඛ්‍යාව 67කි. පසු ගිය සතියේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමට වාර්තා කලේ අප්‍රේල් හා ජූලි මාස දෙක අතර කාලය තුල ඝාතන 706ක් සිදු වී ඇති බව යි. එමෙන් ම ඒවා පිලිබඳව තව මත් කිසිදු පොලිස් පරීක්ෂනයක් සිදු කර නැති බව යි.

පසු ගිය අගෝස්තු 7 වන දා පක්ෂයේ ආධාරකරුවෙකු වූ සිවප්‍රකාසම් මරියදාස් අලුගෝසු අයුරින් ඝාතනය කිරීම සම්බන්ධයෙන් පූර්න පරීක්ෂනයක් පවත්වන ලෙස ඉල්ලා ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය හා *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* ජාත්‍යන්තර උද්ඝෝෂනයක් ගෙන යමින් සිටී. සියලු සාක්ෂ්‍යවලින් හෙලි වන්නේ ඝාතනයට හමුදාව සම්බන්ධ බව යි (බලන්නඃ "ශ්‍රී ලංකාවේ සසපය සිවප්‍රකාසම් මරියදාස් ඝාතනය පිලිබඳ පූර්න පරීක්ෂනයක් ඉල්ලා සිටී").

තම ආන්ඩුවේ ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් වැඩෙමින් පවතින උත්සුකතාවන් දුරු කරනු පිනිස රාජපක්ෂ එක්සත් ජාතීන්ගේ සංවිධානයට කියා සිටියේ, තමන් "මානව අයිතීන් උල්ලංඝනය කිරීම පිලිබඳව එල්ල වන සමහර චෝදනා සම්බන්ධයෙන් සිදු කරන පරීක්ෂන කටයුතු නිරීක්ෂනය කිරීමට ජාත්‍යන්තර ජූරියක්" පත් කරන බව යි. තවත් මුසාවකි. ඇක්ෂන් කොන්ට්‍රෙ ලා ෆෙයිම් සංවිධානයේ සහන සේවකයන් 17 දෙනෙකු ඝාතනය කිරීමෙන් අනතුරුව ද රාජපක්ෂ මේ පොරොන්දුව ම දුන් නමුත් ඉන් පසුව ඒ යෝජනාව ඉවත ලා පරීක්ෂනය ප්‍රාදේශීය මහේස්ත්‍රාත්වරයාට පවරන ලදි.

ප්‍රභූ පොලිස් කොමාන්ඩෝවරුන් විසින් සිදු කරන ලද බවට හැම අතින් ම පෙනී යන පොතුවිල්හි මුස්ලිම් වැසියන් 10 දෙනෙකු ඝාතනය කිරීමේ සිද්ධිය පිලිබඳව ජාත්‍යන්තර පරීක්ෂනයක් පැවැත්විය යුතු බවට කරන ලද ඉල්ලීම ඔහුගේ ආන්ඩුව විසින් ප්‍රතික්ෂේප කලේ රාජපක්ෂ එක්සත් ජාතීන්ගේ සම්මේලනය ඇමතීමට යන්නම් දින තුනකට කලිනි. ආන්ඩුවේ ආරක්ෂක කටයුතු පිලිබඳ ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල ප්‍රකාශ කලේ මේ වන විටත් අවශ්‍ය විශේෂඥ දැනුම ශ්‍රී ලංකාව සතුව සිටින නිසා ජාත්‍යන්තර පරීක්ෂනයක් අනවශ්‍ය බව යි. ශ්‍රී ලංකා පොලීසිය විසින් මීට අදාලව වර්ධනය කර ගෙන ඇති එක ම "විශේෂඥ දැනුම" නම් ආරක්ෂක හමුදාවල සාපරාධී ක්‍රියා කලාපය ආවරනය කිරීමේ හැකියාව යි.

තමන් "දුප්පතුන්ගේ හිතකාමියෙකු" බවට රාජපක්ෂ කරන කියාපෑම ද හම්පඩ ගැසුනු කතන්දරයකි. "මේ අවුරුද්දේ පලමු කාර්තුවේ දී අපි පසු ගිය 28 වසර තුල අත් කර ගත් ඉහල ම වර්ධන මට්ටම වන සියයට 8.1ක වර්ධනයක් වාර්තා කලෙමු," යයි හේ පුරසාරම් දෙඩී ය. "සමානතාවෙන් යුක්තව මේ වර්ධනය තව දුරටත් ඉහල නැංවීමට අපට ඇති අධිෂ්ඨානයත් සමග ම අපි සියලු රටවැසියන්ට අවස්ථා සම්පාදනය කෙරෙන, ඒ අතර ම වර්ධනයේ යන්ත්‍රය ලෙෂ පෞද්ගලික අංශයට සුදුසු ඉඩකඩක් දෙන මූලෝපායක් තෝරා ගෙන ඇත්තෙමු."

ජනාධිපතිගේ අදහස් දැක්වීම, දුප්පතුන් හා පොහොසතුන් අතර එන්න එන්න ම පුලුල් වන අගාධයක් නිර්මානය කරන රෙගුලාසිහරනය හා පෞද්ගලීකරනය පිලිබඳ වෙලඳ පොල හිතවාදී ප්‍රතිපත්ති අඛන්ඩව ගෙන යාමට ඔහුගේ ආන්ඩුව බලාපොරොත්තු වන්නේ ය යන්න සරලව ම ප්‍රකාශයට පත් වීමකි. ජූලි මස දී නිල උද්ධමන අනුපාතිකය 17.7ට නැංගේ ය. මෙය වසර ගනනාවක් තුල ඇති වූ ඉහල ම මට්ටම වන අතර මූලික භාන්ඩ මිල ගනන් තියුනු ලෙස ඉහල යාම පිලිබඳ දර්ශකයක් වේ. පිරිහෙන ජීවන තත්ත්වයන් වර්ජන හා විරෝධතා රැල්ලක් අවුලුවා තිබේ.

බොහෝ කර්මාන්තවල වර්ජන තහනම් කරමින් හා වෘත්තීය සමිති නායකයන් හා අනෙකුත් "උල්පන්දම් දෙන්නන්" අත් අඩංගුවට ගැනීමට බලය පවරමින් රාජපක්ෂගේ ආන්ඩුව අත්‍යවශ්‍ය සේවා නියෝග ඇතුලත් ගැසට් නිවේදනයක් නිකුත් කලේ ය. එම නීති ඉවත් කර ගනිමින් ඊයේ ජනාධිපති ලේකම් කාර්යාලය ප්‍රකාශයක් නිකුත් කල ද එම ක්‍රියාවෙන් ආන්ඩුවේ යටින් පවතින මූලෝපාය සැඟවිය නොහැකි ය. තමන්ට පිලිතුරු නැති ගැඹුරු වන සමාජ අර්බුදයකට මුහුන දී සිටින රාජපක්ෂ ඔහුගේ පූර්වප්‍රාප්තිකයන් අනුගමනය කලා හා සමාන ප්‍රතිගාමී විධික්‍රමවල පිහිට සොයමින් සිටියිඃ එනම් ජීවන තත්ත්වයන් හා ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් මත තව දුරටත් ප්‍රහාර එල්ල කරනු පිනිස සූදානම් වෙද්දී කම්කරු පන්තිය බෙදා වෙන් කිරීම සඳහා වර්ගවාදය ඇවිස්සීම සහ යුද්ධය ඉදිරියට ගෙන යාම ය.

© www.wsws.org